# දරුවා ට රඟපාන්න අවස්ථාව දෙමු

## *ප්‍රවීන රංග චිකිත්සක රවීන්ද්‍ර රණසිංහ විසිනි.*

පුංචි දරුවන් ට රඟපාන හැටි අමුතුවෙන් කියා දෙන්න උවමනාවක් නැහැ. ඒ අය හැම මොහොතකම කරන්නේ මොකක් හරි අත්දැකීමක් රඟ දක්වා පෙන්වීමයි. අපි මේකට අනුකරණ හැකියාව කියලා කියමු. දරුවෙක් අනුකරණ කාර්යය කරන කොට ඒ දරුවා ඉතා හොඳින් වැඩෙන ලක්ෂණ ඇති දරුවෙක් බව අපි තේරුම් ගන්නට ඕනේ. අද දියුණු වෛද්‍ය විද්‍යාත්මක පර්යේෂණවලින් ඔප්පුවී තිබෙන්නේ දරුවෙකු ට අනුකරණ හැකියාව තිබෙනවා නම් ඒ දරුවා ට තමන් අවට ලෝකය ඉතා හොඳින් දැනෙන බවයි. එහෙම දරුවන්ට පෙරළා පිළිතුරු දෙන්නත් හැකියාව තියෙනවා.

දරුවාගේ මනස, හැඟීම් වගේම ශරීරයත් එකට බැඳී ක්‍රියාත්මක වෙන දේවල්. ඒ නිසා සමාජයෙන් එල්ලවෙන සමහර කම්පනයන් දරුවාගේ වැඩීමට අනිවාර්යයෙන්ම බාධාවක් වෙනවා. අද පෙර පාසැලකට එන දරුවෙකුගේ සිත් ඇතුලේ මොන තරම් කම්පනයන් ක්‍රියාත්මක වෙනවාද කියා ගුරුතුමියටවත් නොතේරෙනවා ඇති. මේ නොතේරුම්කම නිසා සමහරවිට දරුවාට කරන තරවටුවකින් ඒ දරුවාගේ මානසික වාගේම ආවේගයන් ට නරක බලපෑම් ඇතිවෙන්න පුළුවන්. ඒ වගේ දරුවන් තමන් එක්ක එක පංතියේ ඉගෙන ගන්න අයට හිංසා කරන්න, පාසැලේ වැඩවලට අවධානයක් නොදෙන්න පුළුවන්. මේ නිසා පුංචි දරු පැටවුන්ගේ සිත් තැලීම මහා විනාශකාරී දෙයක්.

පෙර පාසැල් දරුවෙකුට රඟපෑම ට ඉඩ ලබා දෙනවානම්, ඒක ළමයාගේ වැඩීමට ලොකු උදව්වක්. දරුවා කැමැතියි යම් දෙයක් බවට පත්වෙන්න, නැතිනම් යම් අයෙක් වගේ හැසිරෙන්න. දරුවෙක් තුළ තියෙන මේ උවමනාව නිසා සිත තුළ හැංගිලා තියෙන කම්පනය නිදහස් කර හරින්න පහසුවක් සැපයෙනවා. තමන්ට පීඩාවක් ගෙනෙන දේ විවිධ විදිහට ගෙන දක්වන්න පොඩි දරුවෝ හරි දක්ෂයි. මලක් වෙනවා වගේම නපුරු කෙනෙක් වෙන්නත් ඒ අයට පුළුවන්. ඒ නිසා යහපත් මනසින් යුතු දරුවෝ ගොඩ නැගෙන තැන පෙර පාසැල බව අපි අවධාරණයෙන් කිව යුතුයි. අප දැනට ඉදිරිපත් කර ඇති රංග චිකිත්සා පර්යේෂණ කෘතිවල, දරුවන්ට නිර්මාණාත්මක වෙන්නත්, ඒ අයගේ කම්පනයන් නිදහස් කර හරින්නටත්, ගුරුවරුන් හැටියට අපට උපකාර කල හැක්කේ කෙසේ ද යන්න පැහැදිලිව විස්තර කෙරෙනවා.

# Three books on Dramatherapy

## රංග චිකිත්සාව ගැන පොත් තුනක්







